---

විසර්ජන ශීර්ෂය 317

උතුරු මැද පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව -2010 වර්ෂය

---

1. මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන්.

---

මෙහෙවර

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1978 අංක 42 දරන පළාත් සභා පනතේ හඳුන්වා දී ඇති කාර්යයන්, කර්තව්‍යයන් ඉටු කිරීම.

ප්‍රධාන කාර්යයන්.

---

(අ) මධ්‍යම රජයේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කටයුතු වලට බලපෑමක් ඇති නොවන පරිදි පළාත තුළ මහජන සාමයක් පවත්වා ගැනීම සඳහා පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම.

(ආ) පළාතට අදාළ ආර්ථික සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම, නිශ්චිත නොවන පාසල් සඳහා පහසුකම් සැලසීම හා පළාතේ මහජන සෞඛ්‍ය සේවා කටයුතු පවත්වා ගෙන යාම.

(ඇ) පළාත් පාලන ආයතන පරිපාලනය හා අධීක්ෂණය කිරීම.

(ඈ) කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළඳ ව්‍යවසාය හා ආදායම් ව්‍යාපෘති රජයේ හා සංස්ථාවල එම කටයුතු වලට බාධාවක් නොවන පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

(ඉ) පළාත තුළ මාර්ග ඇතුළු යටිතල පහසුකම් හා කෘෂිකර්ම හා ගොවිජන සේවා කටයුතු වර්ධනය කිරීමද යටිතල පහසුකම් වර්ධනය කිරීම හා සුළු වාරිමාර්ග නඩත්තු කිරීම හා පුනරුත්ථාපනය කිරීම.

2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම.

---

උතුරු මැද පළාත් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ගිණුම් වර්ෂයේ ආරම්භයේ පිළියෙල කර නොතිබුණි.

3. ගිණුම්.

3.1 ගිණුම් ඉදිරිපත් කිරීම.

උතුරු මැද පළාත් සභාව විසින් පිළියෙල කරනු ලබන ගිණුම් සහ ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| ගිණුමේ නම | ගිණුම් අංකය | 2011 අප්‍රේල් 30 දිනට ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම |
|---|---|---|
| විසර්ජන ගිණුම | 317 | ඉදිරිපත් කර ඇත. |

3.2 මුළු ප්‍රතිපාදනය හා වියදම

උතුරු මැද පළාත් සභාව සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.10,830,350,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු.10,681,444,683 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු.148,905,317 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 1.4% ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | වාර්ෂික මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය 2010 දෙසැම්බර් 31 දිනට | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 7,300,000,000 | 7,300,000,000 | 7,300,000,000 | නැත | -- |
| මූලධන | 2,609,850,000 | 3,530,350,000 | 3,381,444,683 | 148,905,317 | 4.2 |
| | 9,909,850,000 | 10,830,350,000 | 10,681,444,683 | 148,905,317 | 1.4 |

3.3 විගණනය හා විෂය පථය.

උතුරු මැද පළාත් සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 මැයි 13 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) වෙත

නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලදී.

3.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ හා ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම.

---

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

3.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය.

---

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා පොත් අනුව උතුරු මැද පළාත් සභා කාර්යාලයේ විසර්ජන ගිණුමේ තත්ත්වය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 3.6 හි දක්වා ඇති නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

(අ) ප්‍රතිපාදන ඉතිරිවීම

---

යුනිසෙෆ් ප්‍රදාන, මාර්ග ආංශික සංවර්ධන ව්‍යාපෘති (ප්‍රතිපූර්ණය කරන විදේශ ණය) සහ එක්සත් ජාතීන්ගේ ජනගහණ ව්‍යාපෘතිය සඳහා වෙන් කළ රු.68,450,000 ක ප්‍රතිපාදන වලින් එකතුව රු.33,074,774 ක් හෙවත් 48.32% ක ප්‍රතිපාදනයක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) නොසැසඳීම්

විසර්ජන ගිණුම අනුව මූලධන වියදම් සඳහා රු.910,751,742 ක පර්පූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන ඇතත්, පර්පූරක බලපත්‍ර 05 ක් මගින් රු.920,500,000 ක මූලධන ප්‍රතිපාදන ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) බැරකම්

පළාත් නිශ්චිත සංවර්ධන, විදේශ ණය, දේශීය අරමුදල්, යුනිසෙෆ්, එක්සත් ජාතීන්ගේ ජනගහන ව්‍යාපෘතිය උපමාන පාදක සහ නවෝදයා යන ප්‍රදාන යටතේ වෙන්කළ රු.3,530,350,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන්, නොලැබුණු ප්‍රමාණය රු.148,905,317 ක් විසර්ජන ගිණුමේ බැරකම් ලෙස දක්වා ඇතත්, එම ප්‍රතිපාදන ලබාදෙන බවට මහා භාණ්ඩාගාරයෙන් තහවුරුවක් ලැබී නොතිබුණි.

3.6 කාර්ය සාධනය

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ 2010 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු.2,045,295,673 ක් වූ අවිච්ඡේද සහ නව සංවර්ධන ව්‍යාපෘති 2025 කින් අතහැර දමන ලද හා 50% ට අඩු භෞතික ප්‍රගතියක් පොන්නුම් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 82 ක් විය.